
# ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2023/2024

**5 වන හා 6 වන මට්ටම**






**අධ්‍යාපන පීඨය**

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන

## 2023/2024

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 2023/2024 අධ්‍යයන වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන පිළිබඳ විස්තර මෙම පොත මඟින් ඉදිරිපත් කෙරේ.

මෙහි අඩංගු තොරතුරුවල නිවැරදි බව සහතික කරලීම සඳහා සෑම උත්සාහයක් ම ගන්නා අතර ප්‍රතිපත්තිමය හෝ මූල්‍යමය කරුණු හේතු කොට ගෙන ඒවා පසුකාලීනව වෙනස් කිරීම්වලට හෝ සංශෝධනවලට භාජනය විය හැකි බවද කරුණාවෙන් සලකන්න.

අධ්‍යාපන පීඨය
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල
නුගේගොඩ.

# අන්තර්ගතය

**පළමුවන කොටස - සාමාන්‍ය තොරතුරු**

**1.0 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

1.1 පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන

1.2 ඉගැන්වීමේ ක්‍රම

1.3 ඇගයීමේ ක්‍රම

1.4 ප්‍රාදේශීය සේවා

1.5 වෙනත් සේවා

1.6 අධ්‍යයන වැඩසටහන් ගාස්තු

**දෙවන කොටස - අධ්‍යාපන පීඨය**

**2.0 ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන**

2.1 පරමාර්ථ හා අරමුණු

2.2 ප්‍රවේශය සඳහා සුදුසුකම්

2.3 වැඩසටහන පිළිබඳ විස්තර

2.4 දින පාසල් හා ශිෂ්‍ය උපදේශන සැසි

2.5 වැඩසටහන් අන්තර්ගතය

2.6 ඇගයුම

2.7 ලකුණු දීමේ පිළිවෙළ

2.8 පාඨමාලා ගාස්තු

2.9 අධ්‍යයන වැඩසටහන/පාඨමාලා කල් දැමීම

2.10 ලියාපදිංචි වු අධ්‍යයන වැඩසටහනින් ඉවත් වීම

2.11 වැඩසටහන හා සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන/අනධ්‍යයන කාර්ය මණ්ඩලය

**ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවනි,**

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන **ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන** හැදෑරීම සඳහා අධ්‍යාපන පීඨයට පිවිසෙන හතරවන අධ්‍යයන කණ්ඩායම ලෙස ඔබ සැම සාදරයෙන් පිළි ගනිමු.

වර්තමානය වන විට ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු වෙමින් පවතින නිසා මෙම පාඨමාලාව හදාරන සිසුන් සඳහා විශේෂ ඉල්ලුමක් රජයේ පාසල්වලින් ලැබෙනු ඇත. පාඨමාලාව සාර්ථක ව සම්පූර්ණ කර සහතිකය ලබා ගන්නා සිසුන් හට රජයේ පාසල්වල ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරුන් ලෙස ගුරු සේවයේ 2. 11 හි පිහිටුවා පත්වීම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරමු. (ගුරුවෘත්තියට බඳවා ගැනීමේ අනෙකුත් මූලික සුදුසුකම් සම්පූර්ණ කර තිබේ නම්) එම නිසා අනාගතයේ සාර්ථකත්වය සඳහා දොරටු විවර වන මෙම වැඩසටහන සම්බන්ධව ඔබ දැනුවත් කිරීම සඳහා නිකුත් කෙරෙන මෙම අත්පොත හොඳින් කියවා දැනුම ලබා ගන්න. මන්ද යත්, දූරස්ථ ක්‍රමය යටතේ උපාධියක් හැදෑරීමට ඔබ අප හා එක්වන බැවිනි.

දූරස්ථ ඉගෙනුම් ක්‍රමවේදය ඔස්සේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සමග **ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන** හදාරන ඔබට, ඔබගේ කථිකාචාර්යවරුන්/

උපදේශකවරුන් මුණ ගැසීමට ලැබෙන්නේ දින පාසල් හා උපදේශන සැසි පවත්වනු ලබන අවස්ථාවල දී පමණි. විශේෂිත වූ අවස්ථාවල දී පමණක් මාර්ගගත සැසි (Online Sessions) වල දී උපදේශකවරුන් සමග කතා කිරීමට අවස්ථාව ලැබෙනු ඇත. එසේ ම දුරබැහැර සිටින ඔබ හා විවෘත විශ්වවිද්‍යාලය අතර දුරකථන හෝ තැපැල් මාර්ගයෙන් සම්බන්ධතා ඇති කර ගැනීමට ඇති ඉඩකඩ ද සීමිත ය. සම්පූර්ණ උපාධි වැඩසටහන පිළිබඳවත්, වැඩසටහන අතරතුර මතුවන විවිධ ගැටලු නිරාකරණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග පිළිබඳවත් ඔබ දැනුවත් විය යුතු ආකාරය මෙම උපදෙස් පොතෙහි ඇති නිසා මෙය ඉතා හොඳින් කියවන්න.

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහනේ සියලු සාර්ථකත්වයන් කරා ළඟා වීමට ඔබට සුබ ප්‍රාර්ථනා කරමු.

**මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය**

**අධ්‍යාපන පීඨය**

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**නාවල.**

# පළමුවන කොටස

## සාමාන්‍ය තොරතුරු

### 1.0 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වර්ෂ 1980 දී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය ශාස්ත්‍රීය වශයෙන් ස්වයංපාලනයක් සහිත ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකි. එය සැලසුම් කොට ඇත්තේ වයස අවුරුදු 18 සහ ඊට වැඩි පුද්ගලයින්ට, මූලික වශයෙන් තමන්ට විවේකී කාල වේලාවට ස්වකීය නිවෙස්වල සිටිය දී ම ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධියක්, ඩිප්ලෝමාවක්, සහතික පත්‍රයක් හෝ වෙනත් යම්කිසි ප්‍රදානයක් හෝ ලබා ගත හැකි අධ්‍යයන වැඩසටහන් හැදෑරීමට හැකිවන අන්දමිනි.

විවෘත විශ්වවිද්‍යාලය ස්වකීය අධ්‍යයන වැඩසටහන් පැවැත්වීම මගින් උපාධි, ඩිප්ලෝමා සහ සහතික ප්‍රදානය කරයි. පූර්ණ කාලීන කාර්ය මණ්ඩලයක් සේවයේ යෙදෙන, සාමාන්‍ය ආකාරයේ මධ්‍යම මණ්ඩපයක් එය සතුව ඇත. ස්වකීය වූ පාලන සභාවක් ද එය සතුව ඇති අතර එය විශ්වවිද්‍යාලයෙහි විධායක සහ ශාස්ත්‍රීය මණ්ඩලය මෙන්ම පාලන අධිකාරිය ද වේ. 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද විවෘත විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ

වෙනත් විශ්වවිද්‍යාලවලට හිමි නෛතික හා ශාස්ත්‍රීය තත්ත්වයම දරයි.

විවෘත විශ්වවිද්‍යාලය එයට බැඳෙන්නා වූ සිසුන්ගේ පැත්තෙන් බලන කල, නිවසෙහි සිට අධ්‍යාපනය ලබා දෙන විශ්වවිද්‍යාලයක් මෙන් ම, පසු අධ්‍යාපනික අවස්ථා සලසා දෙන විශ්වවිද්‍යාලයක් ද වෙයි. කවර හෙයින් ද යත් පාසල් හැර යාමේ දී අවස්ථාවක් අහිමි වූ හෝ යම් අධ්‍යාපන තත්ත්වයක් ලබා නොගත් අයෙකුටත් විවෘත විශ්වවිද්‍යාලය එම අවස්ථාව සලසා දෙන බැවිනි. අනෙකුත් අයට තමන් කලින් ලබා ගත් අවස්ථා හා තත්ත්වයන් වැඩි දියුණු කර ගනිමින් ඒවාට තව තවත් අවස්ථා එක් කර ගැනීමට ද ඉඩ සලසයි. මෙම අවස්ථාවන්ගෙන් නිසි ඵල ලබා ගැනීම සඳහා ඔවුහු වෙහෙසී වැඩ කළ යුතු වෙති.

## 1.1 පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන - පද නිර්වචනය

විවෘත විශ්වවිද්‍යාලයේ වාග් මාලාවට අනුව **පාඨමාලාවක්** යන්නෙන් අදහස් කරන්නේ සාමාන්‍යයෙන් එක් අධ්‍යයන වර්ෂයක් තුළ දී සම්පූර්ණ කරනු ලබන මූලික අධ්‍යයන ඒකකයකි. ඒවා අනිවාර්ය හා වෛකල්පිත විය හැකි ය.

අනිවාර්ය පාඨමාලා හා වෛකල්පිත පාඨමාලා එකතු වී අධ්‍යයන වැඩසටහන් සැකසේ. අධ්‍යයන වැඩසටහනක් සාර්ථක ලෙස හදාරා නිම කිරීම සහතිකයක්, ඩිප්ලෝමාවක්

හෝ උපාධියක් ප්‍රදානය කිරීම සඳහා සුදුසුකමක් වේ. අනිවාර්ය පාඨමාලා යනු යම්කිසි අධ්‍යයන වැඩසටහනක ව්‍යූහය තුළ වූ ද කිසියම් වැඩසටහනක අවශ්‍යතා සපුරාලීම සඳහා ශිෂ්‍යයන් විසින් අනිවාර්යයෙන් සම්පූර්ණ කළ යුතු වූ ද පාඨමාලාවකි. විවෘත විශ්වවිද්‍යාලය සහතිකයක්, ඩිප්ලෝමාවක් හෝ උපාධියක් ලබා දෙන ශාස්ත්‍රීය අධ්‍යයන වැඩසටහන් ඉදිරිපත් කරයි. ඒවා පහත සඳහන් ප්‍රභේද අතුරෙන් එකකට අයත් විය හැකි ය.

1. පදනම් අධ්‍යයන වැඩසටහන්
2. සහතික පත්‍ර අධ්‍යයන වැඩසටහන්
3. උසස් සහතික පත්‍ර අධ්‍යයන වැඩසටහන්
4. ඩිප්ලෝමා අධ්‍යයන වැඩසටහන්
5. ප්‍රථම උපාධි අධ්‍යයන වැඩසටහන්
6. විශේෂ/ගෞරව උපාධි අධ්‍යයන වැඩසටහන්
7. පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්
8. වැඩිදුර අධ්‍යයන වැඩසටහන්
9. ඒකාංගික වැඩසටහන්
10. කෙටිකාලීන පාඨමාලා

පදනම් අධ්‍යයන වැඩසටහන් සම්පූර්ණ කර සහතිකය ලැබීම සෙසු ශාස්ත්‍රීය අධ්‍යයන වැඩසටහන් වලට ඇතුළු වීමේ දොරටුව වෙයි. මෙම පදනම් අධ්‍යයන වැඩසටහන් මූලික

විෂය ක්ෂේත්‍රය තුළ පළමුවන මට්ටම (F1) සහ දෙවන මට්ටම (F2) යනුවෙන් මට්ටම් දෙකකින් පවත්වනු ලැබේ. කලා, වාණිජ්‍යය, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව හෝ තාක්ෂණික විද්‍යාව වැනි අධ්‍යයන ක්ෂේත්‍රයක පදනම් අධ්‍යයන වැඩසටහන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශිෂ්‍යයා සාම්ප්‍රදායික විශ්වවිද්‍යාලවලට ඇතුළු වීම සඳහා අවශ්‍ය අධ්‍යාපන මට්ටමට සමාන මට්ටමකට එළඹෙයි.

තනි වැඩසටහන් යම් ප්‍රමුඛ අධ්‍යාපන වැඩසටහනකට අයත් නොවන වැඩසටහන් වේ. ඒවා එක් එක් පුද්ගලයාගේ පුද්ගලික අවශ්‍යතා අනුව ස්වාධීනව හැදෑරිය හැකි ය.

වැඩසටහනක **ශාස්ත්‍රීය අගය** දැක්වීම සඳහා විවෘත විශ්වවිද්‍යාලය Credit යන වචනය භාවිත කරයි. ''යම් විභාගයක දී ශිෂ්‍යයෙක් පෙන්වන දක්ෂතාවය'' යන්න මෙම වචනයෙන් අදහස් නොවේ. (උදා:- අ.පො.ස. සාමාන්‍ය පෙළ/ උසස් පෙළ විභාගවල දී සම්මාන සාමාර්ථය අදහස නොවේ).

යම් වැඩසටහනක ශාස්ත්‍රීය අගය 30 (30 Credit) යන්නෙන් අදහස් වන්නේ එම වැඩසටහන සඳහා මිඩංගු කළ යුතු අධ්‍යයන කාලය පැය 1500ක් යන්නයි. යම් පාඨමාලාවක ශාස්ත්‍රීය අගය 5 (5 Credit) යන්නෙන් අදහස් වන්නේ එම වැඩසටහන සඳහා මිඩංගු කළ යුතු අධ්‍යයන කාලය පැය

250ක් බවයි. වෙනත් ශාස්ත්‍රීය අගයයන් ඇති පාඨමාලා සඳහා ස්වයං අධ්‍යයන කාලය, ශාස්ත්‍රීය අගය අනුව වෙනස් වේ.

සාමාන්‍ය අධ්‍යයන වැඩසටහනක් හෝ දෙකක් හෝ තුළ අධ්‍යයන වර්ෂයක ශිෂ්‍යයෙකුට ලියාපදිංචි වීමට ඉඩ ලැබෙන්නේ උපරිම වශයෙන් ශාස්ත්‍රීය අගය (credit) 30 ට සමාන අධ්‍යයන වටිනාකමක් ඇති පාඨමාලා සංඛ්‍යාවකට ය. ලියාපදිංචි විය හැකි අවම පාඨමාලා සංඛ්‍යාව ශාස්ත්‍රීය අගය 08ට සමාන වේ. ශාස්ත්‍රීය අගය 30 ක පාඨමාලාවලට ලියාපදිංචි වී ඇති සිසුන්ට ඊට අමතරව, ශාස්ත්‍රීය අගය 8 ට නොවැඩි අධ්‍යයන වටිනාකමක් ඇති වන සේ වැඩිදුර අධ්‍යයන පාඨමාලාවලට ද ලියාපදිංචි විය හැකි ය.

අක්ෂර හා සංඛ්‍යා හතකින් සමන්විත පාඨමාලා කේතයක් පහත සඳහන් පරිදි එකිනෙක පාඨමාලාවන්ට පවරා ඇත.

- පළමු සහ දෙවන අක්ෂරය- අධ්‍යයන ක්ෂේත්‍රය (1 වගුව)
- තුන්වන අක්ෂරය - අධ්‍යයන වැඩසටහන (2 වගුව)
- පළමුවන සංඛ්‍යාංකය - වැඩසටහන තුළ අධ්‍යයන මට්ටම
- දෙවන සංඛ්‍යාංකය - ශාස්ත්‍රීය අගය (3 වන වගුව)
- අවසාන සංඛ්‍යාංක දෙක - පාඨමාලාවේ සුවිශේෂ අනුක්‍රමික අංකය

### වගුව 1 අධ්‍යයන ක්ෂේත්‍ර අනුව පාඨමාලා කේත

| පීඨය | අධ්‍යයන ක්ෂේත්‍රය | පාඨමාලා කේතය |
|---|---|---|
| අධ්‍යාපන | ද්විතියික හා තෘතියික අධ්‍යාපන | ES |
| | මුල් ළමාවිය අධ්‍යාපන | EP |
| | විශේෂ අවශ්‍යතා අධ්‍යාපන | SN |
| | අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ | LM |
| ස්වාභාවික විද්‍යා | ශුද්ධ විද්‍යාව | PS |
| | උද්භිද විද්‍යාව | BT |
| | රසායන විද්‍යාව | CH |
| | භෞතික විද්‍යාව | PH |
| | සත්ත්ව විද්‍යාව | ZO |
| | ගණිතය | MA |
| | හෙද සේවය | NS |
| ඉංජිනේරු තාක්ෂණ | සිවිල් තාක්ෂණය | TC |
| | සන්නිවේදන තාක්ෂණය | TL |
| | පරිගණක විද්‍යාව | CS |
| | විදුලි තාක්ෂණය | TE |
| | ඉලෙක්ට්‍රොනික තාක්ෂණය | TN |
| | ඉංජිනේරු විද්‍යාව | EN |
| | යාන්ත්‍රික තාක්ෂණය | TN |
| | පේෂකර්ම තාක්ෂණය | TT |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා | භාෂා අධ්‍යයන | L S |
| | නීතිය | LW |
| | කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ්‍ය | MC |
| | සමාජ අධ්‍යයන | SS |

| වගුව 2 - පාඨමාලා මට්ටම | | | | | | |
|---|---|---|---|---|---|---|
| මට්ටම | පදනම් | සහතික පත්‍ර | ඩිප්ලෝමා | උපාධි | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | වැඩිදුර අධ්‍යාපන |
| හත | | | | | $P_2$ | $E_7$ |
| හය | | | | $U_4$ | P1 | $E_6$ |
| පහ | | | | $U_3$ | | $E_5$ |
| හතර | | | $D_2$ | $U_2$ | | $E_4$ |
| තුන | | $C_2$ | $D_1$ | $U_1$ | | $E_3$ |
| දෙක | | $C_1$ | | | | $E_2$ |
| එක | | | | | | $E_1$ |
| ශූන්‍ය | | | | | | $E_0$ |

**වගුව 3 - ශාස්ත්‍රීය අගය**

| කේතයේ දෙවන සංඛ්‍යාංකය | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | 1 | 0 |
|---|---|---|---|---|---|---|---|---|---|
| ශාස්ත්‍රීය අංකය | 8 | 7 | 6 | 5 | 4 | 3 | 2 | 1 | 0 |
| වැය කළ යුතු පැය ගණන | 400 | 350 | 300 | 250 | 200 | 150 | 100 | 50 | 0 |

## 1.2 ඉගැන්වීමේ ක්‍රම

මෙය බහු මාධ්‍ය මත පදනම් වී ඇත.

***(1) මුද්‍රිත පාඩම්***

ඉගැන්වීමේ ක්‍රමයෙහි මූලික අංගය වශයෙන් සැළකිය හැක්කේ ශිෂ්‍යයාට දෙනු ලබන මුද්‍රිත පාඩම් ය. මේවා මගින් අධ්‍යයනය කළ යුතු විෂය ක්ෂේත්‍රය ශිෂ්‍යයා වෙත ඉදිරිපත්

කෙරේ. එසේම එමගින් දේශනවලින් වන මෙහෙය ද ඉටු වේ. පාඩම් සමග ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරකම් හා අභ්‍යාස මගින් සිසුන්ගේ විශ්ලේෂණ හැකියාව හා චින්තන ශක්තිය වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

*(2) ශ්‍රව්‍ය දෘශ්‍යාධාර*

මුද්‍රිත පාඩම්වලට අමතරව ශ්‍රව්‍ය දෘශ්‍යාධාර යොදා ගැනීමට විවෘත විශ්වවිද්‍යාලය හැකිතාක් දුරට උත්සාහ කරයි. ස්වයං අධ්‍යයනයෙහි යෙදෙන ශිෂ්‍යයාට මේවා විශේෂයෙන් වැදගත් වේ.

සිසුන්ට සපයන ශ්‍රව්‍ය පටිවලට අමතර ව සෑම ප්‍රාදේශීය මධ්‍යස්ථානයක ම පාඨමාලාවලට අදාළ ශ්‍රව්‍ය පට නැරඹීමේ/ශ්‍රවණය කිරීමේ පහසුකම් ඇත. විශේෂයෙන් ම නාවල ප්‍රාදේශීය මධ්‍යස්ථානයේ ඒ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානයක් විවෘත කර ඇත. සතියේ දිනවල දී සහ සති අන්තවල දී උදේ 9.00 සිට සවස 7.00 දක්වා එය විවෘතව ඇති අතර සිසුන්ට තම තමන්ගේ පාඨමාලාවලට අදාළ ශ්‍රව්‍ය දෘශ්‍ය පටි නැරඹීමට/ශ්‍රවණය කිරීමට එහි පහසුකම් සපයා ඇත.

*(3) දින පාසල් හා උපදේශන සේවා*

ශිෂ්‍යයන්ට ස්වාධීනව ඉගෙන ගැනීම සඳහා මුද්‍රිත පාඩම් හා ශ්‍රව්‍ය දෘශ්‍යාධාර සැලසුම් කොට ඇතත් ඊට අමතර ව දින පාසල් හා නිබන්ධන සැසි මගින් උපදෙස් ලබා දීම විවෘත

විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල දී සිදු කෙරෙනු ඇත.

***(4) පුස්තකාල පහසුකම්***

සියලුම ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථානවල පුස්තකාල පහසුකම් සෑහෙන පමණකට සපයා ඇත. කොළඹ ප්‍රධාන මධ්‍යස්ථානයේ පිහිටි පුස්තකාලය සිසුන් සඳහා සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 7.00 දක්වා විවෘතව ඇත. රජයේ නිවාඩු දිනවල සහ සති අන්තයේ දී පෙ.ව. 9.00 සිට ප.ව. 6.00 දක්වා විවෘත ව ඇත.

## 1.3 ඇගයීමේ ක්‍රම

ශිෂ්‍යයන්ගේ ඉගෙනීම පැවරුම් (අඛණ්ඩ ඇගයීම), ක්‍රම මගින් ද අවසානයේ දී විභාගයකින් ද අගයනු ලැබේ. සෑම පාඨමාලාවක් සඳහා ම සිසුන් නියමිත පැවරුම් සංඛ්‍යාවක් සම්පූර්ණ කළ යුතු ය. මෙම පැවරුම් උපදේශකවරුන්ගේ ගුණදොස් විවේචන හා අදාළ ශ්‍රේණි ද සහිත ව නැවත සිසුන්ට භාර දෙනු ලැබේ. විවෘත විශ්වවිද්‍යාල ඇගයීම් පද්ධතියෙහි ඉතාමත් වැදගත් කොටසක් ලෙස සලකන මෙම පැවරුම් ඒ ඒ පාඨමාලාව අනුව විවිධ ස්වරූපයක් ගනු ඇත. නිදසුන් : විද්‍යාගාර වැඩ, ලිඛිත පැවරුම්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් ආදිය. එක් එක් පාඨමාලාවට නියමිත අඛණ්ඩ ඇගයීම් පටිපාටිය පාඨමාලාව ආරම්භයේ දී සිසුන්ට ද දන්වනු ඇත.

පැවරුම් සාර්ථක ලෙස නිම කිරීමෙන් පසු වසර අවසාන විභාගයට පෙනී සිටීමට ශිෂ්‍යයාට හැකි වේ. කිසියම් පාඨමාලාවක අවසාන විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබන සිසුන් එම පාඨමාලාව සඳහා නැවත ලියාපදිංචි විය යුතු ය.

අවසාන විභාගය අසමත් වන සිසුන් නැවත විභාගයට පෙනී සිටිය යුතු ය. එහෙත් එම විෂයන් සඳහා නැවත පැවරුම් ඉදිරිපත් කළ යුතු නොවේ.

## 1.4 ප්‍රාදේශීය සේවා

ශිෂ්‍යයන්ට ඔවුනොවුන් හමු වී සාකච්ඡා පැවැත්වීම සඳහාත් පන්ති කාමර ඉගැන්වීම සඳහාත් පහසුකම් සැලසීමට විවෘත විශ්වවිද්‍යාලය මගින් දිවයින පුරා ප්‍රාදේශීය හා අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවා ඇත. දැනට විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටුවා ඇත්තේ මෙහි දක්වා ඇති ස්ථානවල ය.

### ප්‍රාදේශීය මධ්‍යස්ථාන

| | | | |
|---|---|---|---|
| WP10 | කොළඹ | NP40 | යාපනය |
| CP20 | මහනුවර | NC50 | අනුරාධපුරය |
| SP30 | මාතර | EP60 | මඩකලපුව |
| NW70 | කුරුණෑගල | UP80 | බදුල්ල |

**අධ්‍යයන මධ්‍යස්ථාන**

| | | | |
|---|---|---|---|
| WP11 | ගම්පහ | SG90 | රත්නපුරය |
| WP12 | කළුතර | SG91 | කෑගල්ල |
| CP21 | හැටන් | NW71 | පුත්තලම |
| SP31 | අම්බලන්ගොඩ | NW72 | කුලියාපිටිය |
| SP32 | ගාල්ල | NP41 | වව්නියාව |
| SP33 | අම්බලන්තොට | NP42 | කිලිනොච්චිය |
| UP81 | බණ්ඩාරවෙල | EP61 | අම්පාර |
| UP82 | මොණරාගල | EP62 | ත්‍රිකුණාමලය |
| NC51 | පොළොන්නරුව | NP43 | මුලතිව් |

මෙම ප්‍රාදේශීය/අධ්‍යයන මධ්‍යස්ථානවල දී මුද්‍රිත පාඩම් බෙදා දීමට පහසුකම් සලසා ඇත. එසේම සම්පූර්ණ කළ පැවරුම් භාර ගැනීම ද මෙම මධ්‍යස්ථානවල දී සිදු කෙරේ. කොළඹ, මහනුවර සහ මාතර මධ්‍යස්ථානවල විද්‍යාගාර පහසුකම් ද ඇත.

කෙසේ වුවද පන්ති කාමර ඉගැන්වීම සඳහා අධ්‍යයන මධ්‍යස්ථානයක් ප්‍රයෝජනයට ගැනීම, ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් විසින් එම මධ්‍යස්ථාන තෝරා ගැනීම සහ ආචාර්ය මහත්ම මහත්මීන් ලබා ගැනීමේ පහසුව මත රඳෙන බව සැළකිය යුතු ය.

## 1.5 වෙනත් සේවා

### *(1) ආපන ශාලා පහසුකම්*

විශ්වවිද්‍යාල ආපන ශාලාවෙන් සතියේ දිනවල හා සති අන්තවල දී සාධාරණ මිලකට ආහාර ලබා ගත හැකි ය. මහනුවර හා මාතර මධ්‍යස්ථානවල ද ආපනශාලා පහසුකම් ඇත.

## 1.6 අධ්‍යයන වැඩසටහන් ගාස්තු

අධ්‍යයන වැඩසටහනකට ලියාපදිංචි වීමේ දී හා ගාස්තු ගෙවීමට නියමිත අවස්ථාවල දී ඒවා අප්‍රමාද ව ගෙවිය යුතු ය. පූර්ව දැනුම්දීමකින් තොර ව ඕනෑම අවස්ථාවක ගාස්තු සංශෝධනය කිරීමේ බලය විශ්වවිද්‍යාලය සතු ය. එක් එක් අධ්‍යයන වැඩසටහන අනුව ගාස්තු වෙනස් වන අතර **2.8** යටතේ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහනෙහි 5 වන හා 6 වන මට්ටම සඳහා ගාස්තු පිළිබඳ විස්තර ඇතුළත් කර ඇත.

## දෙවන කොටස

# අධ්‍යාපන පීඨය

වර්ෂ 2003 දී ස්ථාපිත කරනු ලැබූ අධ්‍යාපන පීඨය අධ්‍යයනාංශ හතරකින් සමන්විත ය.

1. මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය
2. ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන අධ්‍යයනාංශය
3. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන අධ්‍යයනාංශය
4. අධ්‍යාපන නායකත්ව හා කළමනාකරණ අධ්‍යයනාංශය

**ප්‍රාථමික හා මුල් ළමාවිය අධ්‍යාපන අධ්‍යයනාංශය**

ඔබ අයත් වන්නේ මෙම අධ්‍යයන අධ්‍යයනාංශයට යි. එය අප ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉතා වැදගත් ම අධ්‍යයනාංශ අතුරින් එකක් බව පවසන්නේ සාඩම්බරයෙනි. අප අධ්‍යයනාංශය මගින් ප්‍රධාන අධ්‍යයන වැඩසටහන් දෙකක් (02) ඉදිරිපත් කරනු ලබයි. එනම්,

1. පෙරපාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතිකපත්‍ර වැඩසටහන (Advanced Certificate in Pre-School Education Programme)

2. ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන (Bachelor of Education (Honourse) in Primary Education Programme)

## 2.0 ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන (5 වන හා 6 වන මට්ටම)

## Bachelor of Education (Honours) in Primary Education Programme (Level 5 & Level 6)

වැඩසටහන් කාල සීමාව **මාස 24 කි. (අවුරුදු දෙකකි)**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය මගින් මෙහෙයවන මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (Diploma in Early Childhood and Primary Education Programme) සාර්ථක ව සම්පූර්ණ කර සහතිකය ලබාගත් සිසුන්ට 5 වන මට්ටමේ දී මෙම වැඩසටහනට සම්බන්ධවිය හැකි ය.

මෙම සමස්ත වැඩසටහන (මට්ටම 3, 4, 5, 6) ශාස්ත්‍රීය අගයයන් (Credit) 120 ක් වන අතර සෑම මට්ටමකදී ම සිසුන් විසින් ශාස්ත්‍රීය

අගයයන් (Credit) 30ක් සම්පූර්ණ කළ යුතු වේ. ඒ අනුව පස්වන මට්ටමට ලියාපදිංචි වන සිසුන් 5 හා 6 මට්ටමේ දී ශාස්ත්‍රීය අගයයන් (Credit) 60ක් සම්පූර්ණ කළ යුතු වේ.

## 2.1 ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහනෙහි පරමාර්ථ හා අරමුණු

- පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන සාර්ථක ව සම්පූර්ණ කළ ශිෂ්‍යයන්ට වැඩිදුර අධ්‍යාපන අවස්ථා ලබා දීම.
- මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන සාර්ථක ව සම්පූර්ණ කර සහතිකය ලැබූ උපාධිධාරීන් නොවන ශිෂ්‍යයන්ට ප්‍රථම උපාධිය සමග ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ වෘත්තීය පුහුණුව ලබා දීම.
- උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාලයකට පිවිසීමට සුදුසුකම් නොලැබූ සිසුන්ට උසස් අධ්‍යාපන අවස්ථා උදා කරලීම.
- ගුරු වෘත්තියට පිවිසීමට බලාපොරොත්තු වන උපාධිධාරී නොවන ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍රය හෝ ඩිප්ලෝමාව ලැබූ ශිෂ්‍යයන් හට වෘත්තීමය සුදුසුකමක් සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම.

## 2.2 ප්‍රවේශය සඳහා සුදුසුකම් (5 වන මට්ටමට)

- ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය මගින් මෙහෙයවන මුල්ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන (Diploma in Early Childhood and Primary Education Programme) සම්පූර්ණ කිරීම

හෝ

- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ මගින් පිරිනමනු ලබන ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ජාතික ශික්‍ෂණ විද්‍යා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම

## 2.3 වැඩසටහන පිළිබඳ විස්තර

- වැඩසටහන සම්බන්ධ දින පාසල් හා කාර්ය සැසි පහත සඳහන් මධ්‍යස්ථානවල ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටියහොත් (සිසුන් 15කට වැඩියෙන්) සිංහල, ඉංග්‍රීසි සහ දමිළ මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.
- ඔබ වෙනුවෙන් පැවැත්වෙන සෑම දින පාසලක් සඳහා ම සහභාගිත්වය ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථකව නිම කර ගැනීමට උපකාර වනු ඇත.

## මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය
## ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි
## වැඩසටහන 2023/2024
## 5 වන මට්ටම - දින පාසල් මධ්‍යස්ථාන

| **මධ්‍යස්ථානය** | **සිංහල** | **ඉංග්‍රීසි** | **දෙමළ** |
|---|---|---|---|
| කොළඹ | X | X | X |
| නුවර | X | X | X |
| කිළිනොච්චි | | | X |
| අම්පාර | X | | X |
| බණ්ඩාරවෙළ | X | | X |
| කුරුණෑගල | X | | |
| අම්බලන්තොට | X | | |
| වව්නියා | | | X |
| ත්‍රිකුණාමලය | | | X |
| රත්නපුර | X | | |
| පුත්තලම | | | X |
| පොළොන්නරුව | X | | |
| මුලතිව් | | | X |
| මන්නාරම | | | X |
| මාතර | X | | |
| කළුතර | X | | |
| කෑගල්ල | X | | |
| යාපනය | | | X |
| හැටන් | | | X |
| ගම්පහ | X | | |
| ගාල්ල | X | | |
| අනුරාධපුරය | X | | |
| මඩකළපුව | | | X |

## 2.4 දින පාසල් හා ශිෂ්‍ය උපදේශන සැසි

දැනුම ලබා දීමේ ප්‍රධාන ක්‍රමය මුද්‍රිත පාඩම් (මොඩියුල) වේ. ඒ වෙනුවෙන් පැවැත්වෙන දැනුවත් කිරීමේ සැසි දින පාසල් නමින් හඳුන්වයි. ඔබ සඳහා මාසයකට දෙවරක් දින පාසල් පැවත්වෙන අතර සෑම දිනපාසලකට ම පැමිණීම ඔබට ඵලදායී බව මතක තබා ගන්න. මෙම මුද්‍රිත පාඩම්වලට අමතර ව පුස්තකාල භාවිතය ද වැදගත් වනු ඇත. එසේ ම ශ්‍රව්‍ය, දෘශ්‍ය පට භාවිතයට ද කටයුතු සලසා ඇත. සාකච්ඡා, කාර්ය සැසි, ක්‍රියාකාරකම් පාදක ස්වරූපයන්ගෙන් මෙම දින පාසල් පවත්වනු ලැබේ. එසේ ම මෙම දින පාසල්වල දී මුද්‍රිත පාඩම් යාවත්කාලීන කිරීමට හා ඔබගේ අධ්‍යයන ගැටලු සාකච්ඡා කිරීමටත් අපේක්ෂා කෙරේ. සෑම මසක ම දෙවරක් දින පාසල් පැවැත්වෙන අතර සෑම දින පාසලක් සඳහා ම සහභාගී වීම ඔබට වැදගත් වේ. දින පාසල් පැවැත්වීමේ ස්වභාවය හා එහි අරමුණු පිළිබඳ ව සමාරම්භක සැසියේ දී ඔබව දැනුවත් කරනු ඇත.

එසේම දින පාසල්වලට අමතර ව කුඩා කණ්ඩායම් වශයෙන් සංවිධානය කරනු ලබන උපදේශන සැසි ද ඔබ වෙනුවෙන් අවශ්‍ය වූ විටෙක පැවැත්වෙනු ඇත. මෙම උපදේශන සැසිවල දී සිසුන්ගේ ඉගෙනීම් කටයුතු සම්බන්ධ ගැටලු, පැවරුම් සම්බන්ධ ගැටලු හා වෙනත් අදාළ ගැටලු සාකච්ඡා කිරීමටත්, අවසාන විභාගය සඳහා ඔබ යොමු කිරීමටත් අපේක්ෂා කරනු ලැබේ.

ඇතිවන නව තත්ත්වයන්ට මුහුණ දීමේ දී ශිෂ්‍ය උපදේශන සැසි මාර්ගගත ක්‍රමයට (Online) ද පැවැත්වීමට ඉඩකඩ පවතී.

## 2.5 වැඩසටහන් අන්තර්ගතය

මෙම වැඩසටහන මට්ටම් දෙකකින් පැවැත්වේ.

### 5 වන මට්ටම

මෙම මට්ටම පාඨමාලා නවයකින් සමන්විත ය. 5 වන මට්ටමට බැඳෙන සිසුන් අනිවාර්ය පාඨමාලා 7ක් සමග පළමු භාෂාව දෙමළ හෝ පළමු භාෂාව සිංහල යන පාඨමාලා දෙකෙන් එකක් සමග පාඨමාලා 8ක් සම්පූර්ණ කළ යුතු වේ. පාඨමාලා සඳහා අදාළ මොඩියුල ඔබ ලියාපදිංචිවන මධ්‍යස්ථානයෙන් ඔබට ලබා ගත හැකි ය. ශිෂ්‍ය ලියාපදිංචියේ දී හෝ පාඨමාලාව ආරම්භයේ දී මෙම මොඩියුල ඔබට ලබා ගැනීමට හැකි වනු ඇත.

ඔබ ලියාපදිංචි වන අවස්ථාව වන විට අදාළ මොඩියුල සූදානම් ව නොතිබුණහොත් අදාළ අධ්‍යයන කටයුතු ආරම්භයට පෙර එම මොඩියුල ඔබ අතට පත් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කරනු ඇත.

## 5 වන මට්ටමේ පාඨමාලා අන්තර්ගතය

| අනිවාර්ය පාඨමාලා | | |
|---|---|---|
| පාඨමාලා කේතය | පාඨමාලා | සම්මාන ඇගයිම |
| EPU5550 | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපන මනෝවිද්‍යාව | 05 |
| EPU5551 | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපනයේ පදනම | 05 |
| EPU5552 | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා අධ්‍යාපන තාක්ෂණය | 05 |
| EPU5353 | ප්‍රාථමික ඉගැන්වීම සඳහා ගණිතය | 03 |
| EPU5354 | ප්‍රාථමික ඉගැන්වීම සඳහා සෞන්දර්ය අධ්‍යාපනය | 03 |
| EPU5255 | ප්‍රාථමික ඉගැන්වීම සඳහා විද්‍යාව සහ පරිසරය | 02 |
| EPU5256 | ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ළමා අයිතිවාසිකම් | 02 |
| EPU5557<br><br>LEU5558 | ප්‍රාථමික පාසල් ගුරුවරුන් සඳහා පළමු භාෂාව - සිංහල හෝ<br>පළමු භාෂාව - දෙමළ | 05 |
| | මුළු සම්මාන ගණන | 30 |

## 6 වන මට්ටමේ පාඨමාලා අන්තර්ගතය

5 වන මට්ටම සාර්ථකව නිම කළ ඔබ විසින් 6 වන මට්ටමේ දී ප්‍රධාන පාඨමාලා හතක් සම්පූර්ණ කළ යුතු ය. මෙම මට්ටමේ දී ඔබ ප්‍රායෝගික ඉගැන්වීමට ද සම්බන්ධ වන හෙයින් ඔබ විසින් දැන ගත යුතු කරුණු විශාල ප්‍රමාණයක් වෙයි. මේ නිසා මෙය හොඳින් කියවන්න. ඔබට පැහැදිලි නැති යමක් ඇත්නම් විමසා දැන ගන්න.

| අනිවාර්ය පාඨමාලා | | |
|---|---|---|
| පාඨමාලා කේතය | පාඨමාලා මාතෘකාව | සම්මාන ඇගයීම |
| EPU6230 | ප්‍රාථමික පාසල් වාතාවරණය තුළ අන්තර්කරණ අධ්‍යාපනය | 02 |
| EPU6231 | ප්‍රාථමික පාසල් වාතාවරණය තුළ මාර්ගෝපදේශය හා උපදේශනය | 02 |
| EPU6332 | ප්‍රාථමික අධ්‍යාපනයේ සමකාලීන ගැටලු | 03 |
| EPU6533 | ප්‍රාථමික අධ්‍යාපනය තුළ තක්සේරුකරණ ක්‍රියාවලිය | 05 |
| EPU6234 | ප්‍රාථමික පංතිකාමර කළමනාකරණය | 02 |
| EPU6835 | ප්‍රායෝගික ගුරු පුහුණුව - ප්‍රාථමික මට්ටම (ඉගැන්වීම පුහුණුව) | 08 |
| EPU6836 | ප්‍රාථමික අධ්‍යාපනය තුළ ව්‍යාපෘති | 08 |
| | මුළු සම්මාන ගණන | 30 |

**සාමාර්ථය**

**ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)** උපාධිය සඳහා පළමු පෙළ හෝ දෙවන පෙළ හෝ සාමාර්ථයක් හෝ ලබා ගැනීමට නම් අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කරන අතර ම ප්‍රායෝගික ඉගැන්වීම සඳහා B+ හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා ගැනීම අත්‍යවශ්‍ය බව සලකන්න.

**ප්‍රායෝගික ඉගැන්වීම් කල් දැමීම**

යම් හේතුවක් නිසා ඔබ අදාළ අධ්‍යයන වර්ෂයේ දී ප්‍රායෝගික ඉගැන්වීම සඳහා ඉදිරිපත් නොවීමට බලාපොරොත්තු වන්නේ නම් 6 වන මට්ටමේ දී (EPU6835) පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමෙන් වළකින්න.

## 2.6 ඇගයුම

ඇගයුම කරනු ලබන්නේ පහත සඳහන් ක්‍රම මගිනි.

**නියම කරන ලද අනිවාර්ය පැවරුම් මගින් සිදු කරන අඛණ්ඩ ඇගයුම්:**

පැවරුම් නියමිත දිනට ම සම්පූර්ණ කොට භාර දිය යුතු ය. ශාස්ත්‍රීය අගය 5 ක් හෝ ඊට වැඩි පාඨමාලා සඳහා නියමිත පැවරුම් ගණන 3 කි. අවසාන පරීක්ෂණය සඳහා යෝග්‍යතාව ලැබීමට නම් නියමිත පැවරුම් 3 ම භාර දී එම පැවරුම් සඳහා “C” හෝ ඊට ඉහළ ශ්‍රේණි ලබා ගත යුතු ය.

පැවරුම්වලින් 40% ක ප්‍රතිශතයක් අවසාන ලකුණු ගණනය කිරීමේ දී යොදා ගනු ලැබේ.

ශාස්ත්‍රීය අගය 4 ක් හෝ ඊට අඩු පාඨමාලාවක් සඳහා නියමිත පැවරුම් ගණන දෙකකි. එම පැවරුම්වලට C හෝ ඊට ඉහළ ශ්‍රේණියක් ලැබීමෙන් යෝග්‍යතාව ලබාගත හැකි ය. අවසාන විභාග ලකුණු ගණනය කිරීමේ දී ඉන් 40% ක් යොදා ගනු ලැබේ.

**පැවරුම භාර දිය යුතු අවසාන දිනට පසු කිසිඳු හේතුවක් මත පැවරුම් භාරගනු නොලැබේ.** එසේ ම දින පාසල් පැවැත්වෙන දිනයන් හි දී ඒ සඳහා සහභාගී නොවී පැවරුම් ලිවීමට අවස්ථාව දෙනු නොලැබේ. හදිසි අවස්ථාවක දී ඔබ රෝගි වුවහොත් රජයේ රෝහලකින් ලබාගත් වෛද්‍ය සහතිකය සමඟ සතියක් ඇතුළත පැවරුම භාරදිය යුතු ය.

**වැදගත් :**

සෑම පාඨමාලාවක් සඳහා ම නියමිත පැවරුම් ගණන සම්පූර්ණ කර භාර දිය යුතු ය. පැවරුම් භාර නොදුනහොත් ඔබට අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට යෝග්‍යතාව නොලැබෙනු ඇත. එම නිසා කරුණාකර පාඨමාලාවට නියමිත පැවරුම් නියමිත දිනයන්හි දී සම්පූර්ණ කර භාර දීමට කටයුතු කරන්න. එසේ ම ඔබගේ ජ්‍යෙෂ්ඨයින්ගේ හෝ ඔබේ මට්ටමේ සිසුන්ගේ පැවරුම් කොපි කිරීමෙන්

වලකින්න. අලුතින් යමක් ඉගෙනීම සඳහා ඔබ විසින් ම, ස්වයං අධ්‍යයනයක් මඟින් ම පැවරුම් ලිවීමට උත්සාහ ගන්න.

## 2.7 ලකුණුදීමේ පිළිවෙළ

| Mark Range Z % | Grade | Grade Point Value |
|---|---|---|
| 85-100 | A+ | 4.0 |
| 70-84 | A | 4.0 |
| 65-69 | A- | 3.7 |
| 60-64 | B+ | 3.3 |
| 55-59 | B | 3.0 |
| 50-54 | B- | 2.7 |
| 45-49 | C+ | 2.3 |
| 40-44 | C | 2.0 |
| 35-39 | C- | 1.7 |
| 30-34 | D+ | 1.3 |
| 20-29 | D | 1.0 |
| 00-19 | E | 0.0 |

Not eligible (35-39 to 00-19)

## 2.8 පාඨමාලා ගාස්තු : 2022/2023

ශිෂ්‍යයින් විසින් අදාළ ගෙවීම් වාරික දෙකකින් සිදු කළ යුතු ය. ලියාපදිංචි වීමේ දී පළමුවන වාරිකය ගෙවිය යුතු ය. ඉතිරි මුදල් ගෙවිය යුතු දිනය විශ්වවිද්‍යාලය විසින් නියමිත කාලයේ දී වවුචර්පත් එවීමෙන් දැනුවත් කරනු ඇත. විභාග අසමත් වන ශිෂ්‍යයින්ට නැවත ලියාපදිංචි වීමේ දී නැවත අධ්‍යයනය කිරීමට සිදු වන පාඨමාලා අනුව ගාස්තු ගෙවීමට සිදුවනු ඇත.

| | |
|---|---|
| ලියාපදිංචි ගාස්තු | - රු. 500.00 |
| පහසුකම් ගාස්තු | - රු. 2 500.00 |
| පුස්තකාල පහසුකම් ගාස්තු | - රු. 100.00 |
| පාඨමාලා ගාස්තු මට්ටම 5/6 සඳහා (එක් සම්මානයක් සඳහා) | - රු. 2 320.00 |
| Start @ OUSL Programme - | - Rs. 8 500.00 |

**සැ. යු. -** වැඩසටහන එක් මට්ටමක් සඳහා වන ගාස්තු ගණනය සඳහා එක් සම්මානයක් සඳහා වන ගාස්තුව සම්මාන ගණනින් ගුණ කර ලැබෙන එකතුවට ඉහත සඳහන් අනෙකුත් ගාස්තු එකතු කළ යුතු ය.

**ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව)** උපාධි වැඩසටහනේ එක් වර්ෂයක් සඳහා **සම්මාන 30ක්** ඇතුළත් වේ.

## 2.9 අධ්‍යයන වැඩසටහන/පාඨමාලා කල් දැමීම

ලියාපදිංචි වී ඇති සම්පූර්ණ අධ්‍යයන වැඩසටහන කල් දැමීමට අවසර දෙනු නො ලැබේ. පාඨමාලා කල් දැමිය හැකි කාල සීමාව වැඩසටහන ආරම්භ වී මාස 1 1/2 කින් අවසන් වේ. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය දීර්ඝ කරනු නොලැබේ. නැවත ලියාපදංචි වීමේ දී පළමු අවස්ථාවට වඩා වැඩි ගාස්තුවක් ගෙවීමට සිදු වනු ඇත.

## 2.10 ලියාපදිංචි වු අධ්‍යයන වැඩසටහනින් ඉවත් වීම

වැඩසටහනට ලියාපදිංචි වීමෙන් පසුව මසක් ඉකුත් වීමට පෙර 10% ක ගාස්තුවකට යටත් ව ලියාපදිංචි වූ අධ්‍යයන වැඩසටහනින් ඉවත් විය හැකි ය. කුමන හේතුවක් නිසා හෝ මෙම දිනය දීර්ඝ කරනු නොලැබේ. විශ්වවිද්‍යාලය විසින් ලියාපදිංචි වීම/නැවත ලියාපදිංචි වීම සඳහා පැමිණිය යුතු බවට දන්වා එවන දිනයන්ට පසුව ලියාපදිංචි වීමේ කටයුතු කරනු නො ලැබේ.

ඔබගේ අධ්‍යයන වැඩකටයුතු සර්වප්‍රකාරයෙන් ම සාර්ථක වනු දැකීම අපගේ අපේක්ෂාවයි.

සුබ පැතුම් !

**2.11 වැඩසටහන ක්‍රියාත්මක කරන අධ්‍යයනාංශය හා වැඩසටහන සම්බන්ධව කටයුතු කරන කථිකාචාර්ය මණ්ඩලය**

**ඔබ අයත් වන අධ්‍යයනාංශය**

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය

**ඔබ අයත් වන අධ්‍යයනාංශයේ අංශ ප්‍රධානතුමා**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ටී. මුකුන්දන් මයා.

දුරකථන අංකය 011 2 881 400

**ඔබගේ වැඩසටහනේ සම්බන්ධීකාරකතුමිය (පස්වන මට්ටම)**

ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී, ආචාර්ය ඉනෝකා දීප්තිණී දෙදියවල

දුරකථන අංකය 011 2 881 482

**වැඩසටහන සම්බන්ධව කටයුතු කරන අධ්‍යයන කාර්ය මණ්ඩලය**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මහාචාර්ය ටී. මුකුන්දන්

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පී. සෙනෙවිරත්න

ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී ආචාර්ය, ඉනෝකා දීප්තිණී දෙදියවල

කථිකාචාරිණී ජේ. දිලානි

ජ්‍යෙෂ්ඨ කථිකාචාරිණී සමන්ති ජයසිංහ

කථිකාචාරිණී දීප්ති කුමාරි

කථිකාචාරිණී යශෝබා රත්නායක

කථිකාචාරිණී ඒ. එස්. පී. යුම්නා

**වැඩසටහන සම්බන්ධව කටයුතු කරන අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

(මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන අධ්‍යයනාංශය)

ගංගා චාන්දනී මිය.

ආරාධනා සේනානායක මෙනවිය.

සතිකා පෙරේරා මිය.

පී. සෙනෙවිරත්න මයා.